## ජයග්‍රහණයෙන් වසරකට පසු

දෙමළ බෙදුම්වාදය හා දෙමළ ත්‍රස්තවාදය සමගින් ලොවේ බිහි වූ දරුණුතම ෆැසිස්ට්වාදයක් නන්දිකඩාල් කලපුවේ ගිල්වා දහඅටවැනිදාට වසරක් ගතවෙයි. එහෙත් දෙමළ ජාතිවාදය බටහිරයන්ගේ පිහිටෙන් ලොවේ විසිරුණු දෙමළ ජනතාව මගින් තවමත් හොල්මන් කරයි. ඒ අතර ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට විසඳුමක් ලෙස පොලිස් බලතල හා ඉඩම් බලතල පළාත් සභාවලට අත්කර දී දහතුන්වැනි සංශෝධනය ක්‍රියාත්මක කරන ලෙස සම්බන්ධන් ඇතුලු දෙමළ ජාතිවාදීන් කිහිපදෙනෙක් ඉල්ලා සිටිති. මොවුන්ට ඉන්දියාවේ සහාය ලැබෙන බව ද පෙනී යයි.

කොටි සංවිධානය පැරදවීමේ ගෞරවයෙන් කිනම් ප්‍රතිශතයක් අපට හිමිවිය යුතුදැයි අපි නො දනිමු. දෙමළ ත්‍රස්තවාදය පැරදවිය හැකිය හා යුතු ය යන මතවාදය අවසානයේ දී ජයග්‍රහණය කිරීම පිළිබඳ ව අපට ඇත්තේ නොමඳ සතුටකි. මගේ දරුවන් හදාවඩා ගැනීමේ සතුට හැරෙන්නට ජීවිතයේ ඇති ප්‍රධාන ම සතුටත් සාර්ථකත්වයත් ඒ මතවාදය ජයග්‍රහණය කරවීමට දායකවීම වෙයි. හෙට අනිද්දා විශ්‍රාම ගැනීමට නියමිත මට ගුරුවරයකු ලෙස ඇත්තේ අසාර්ථකත්වය පිළිබඳ මතක සටහන් රාශියක් පමණක් බැවින් දෙමළ ජාතිවාදී මතවාදය පරාජය කිරීම හා සම්බන්ධ ඉතිහාසය මම ඉතා සතුටින් නැවත නැවතත් මෙනෙහි කරමි. මා උගන්වා ඇති අයගෙන් අති විශාල බහුතරය මගෙන් කිසිවක් ඉගෙන නැත. ඔවුන් ඉගෙන ඇත්තේ ඕනෑම අයකුගෙන් ඉගෙනගත හැකි පොතපතෙහි සඳහන් දේ පමණකි. මගෙන් යම්කිසිවක් උගත් බොහෝ දෙනෙක් අද ඒ උගත් දෙයට විරුද්ධ මත දරති. ඔවුහු හැකි අවස්ථාවල ඒ තමන් උගත් දෙයට විරුද්ධ ව ලියති. කියති. ඒ අවතක්සේරු කරති.

ඉඳහිට අතීතය දන්නා ලේඛකයකු දෙන්නකු හැරෙන්නට වෙන කිසිවෙක් නිල වශයෙන් හෝ නොනිල වශයෙන් හෝ දෙමළ ජාතිවාදය පරාජය කිරීමෙහි ලා අපේ දායකත්වය ගැන කතා නො කරති. ඒ අගය නො කරති. එයට හේතුව එහි අගය කිරීමට තරම් දෙයක් නොමැතිවීම විය හැකි හෙයින් ඒ ගැන කළහැකි දෙයක් නැත. මා මේ කරුණු මෙපමණකින්වත් සඳහන් කරන්නේ විශේෂ කරුණක් ගැන කීමට ය. කණ්ඩායමක් ලෙස ගතහොත් දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යන මහත්වරුන්ට හා ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ට පොලිස්පතිතුමන්ට සිවිල් ආරක්ෂක බලකායේ ප්‍රධානියාට හා රණවිරුවන්ට ය. මහින්ද රාජපක්ෂ මහතා සේනාධිනායක පමණක් නො විය. හමුදා මෙහෙයුම්වලට දේශපාලන නායකත්වය ලබාදුන්නේ ඒ මහතා ය. මෙහෙයුම් නතරකිරීමට විදේශවලින් එල්ල වූ විවිධ බලපෑම් හමුවේ ඉන්ද්‍රඛීලයක් සේ නොසැළී සිටියේ ඒ මහතා ය. ගෝඨාභය රාජපක්ෂ මහතා මෙහෙයුම් සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දුන්නේ ය. උපක්‍රම පිළිබඳ උපදෙස් දුන්නේ ය.

ඒ අතර ආරක්ෂක අංශවල ප්‍රධානීහු තම කාර්ය ඉටුකළහ. එහෙත් ඒ එක් අයකුවත් දෙමළ ත්‍රස්තවාදය පරාජය කෙළේ තමන් යැයි පවසමින් ඒ පිළිබඳ ගෞරවය තමන්ට පමණක් ලබාගැනීමට උත්සාහ කිරීම වීරත්වයක් නොව නිවට කමකි. සරත් ෆොන්සේකා මහතා මෙහෙයුම් සම්බන්ධයෙන් අගය කළ යුතු දායකත්වයක් ලබාදුන් බවට සැකයක් නැත. එහෙත් හමුදාවේ සරත් ෆොන්සේකාලා තවත් දාහක් වෙති. ඔවුන්ගෙන් කවරකුට වුව ද හමුදාවට නායකත්වය සැපයීමේ හැකියාව තිබිණි. එහෙත් අප කලින් ද කියා ඇති පරිදි මහින්ද රාජපක්ෂලා ඇත්තේ එක් අයකු හා එක් අයකු පමණකි. අපේ මතවාද නොවන්නට මෙහෙයුම් ජයගැනීමට නොහැකි යැයි කියමින් අපට මහින්ද රාජපක්ෂ මහතා සමග ජයග්‍රහණය පිළිබඳ සම තත්වයක් ඉල්ලා සිටිය නො හැකි ය. සරත් ෆොන්සේකා මහතා දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීම සම්බන්ධයෙන් අපට වඩා අගය කළ යුතු දායකත්වයක් ලබා දී ඇති නමුත් ජයග්‍රහණයේ භුක්තිය ප්‍රධාන වශයෙන් ම තමන්ට හිමිවිය යුතු යැයි ඔහුට කිව නො හැකි ය.

දෙමළ ත්‍රස්තවාදය පැරදවීමේ ගෞරවය පිළිබඳ එක් අයකුගේ නම සඳහන් කරන්නේ නම් ඒ මහින්ද රාජපක්ෂ මහතාගේ නම ය. හයවැනි පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව මෙවැනි ජයග්‍රහණයක් ලබාගත් වෙනත් කිසිවකු නැත. එහෙත් මෙරට ඇතැම් තකතීරු ජනමාධ්‍යවල (ජඩමාධ්‍යවල) ප්‍රචාරය කෙරුණේ සරත් ෆොන්සේකා නොවන්නට ඒ ජයග්‍රහණය අපට නොලැබෙන බව ය. තවමත් ඇතැමුන් අතර ඇති මේ මතය බිඳ දැමුමට ආණ්ඩුව සමත් වී නැත. එපමණක් නො වේ. ඇතැමුන් තවමත් සිතන්නේ සරත් ෆොන්සේකා හමුදා අත් අඩංගුවට ගෙන ඇත්තේ පෞද්ගලික පළිගැනීමට බව ය. මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව ජනාධිපතිවරණයෙහි දී තරග කළ බැවින් ඔහු අත් අඩංගුවට ගෙන ඇතැයි ඇතැම්හු විශ්වාස කරති.

© Prof. Nalin De Silva

සුදු කොඩි සම්බන්ධ සිද්ධිය ජනතාව අතරට ගොස් ඇතැයි කිව නො හැකි ය. සුදු කොඩි කතාව සරත් ෆොන්සේකා විසින් පවසනු ලැබුයේ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ දී පමණක් නො වේ. ඔහු සන්ඩේ ලීඩර් පුවත්පතට ද පසුව රත්නපුරේ හා වෙනත් නගරවල පැවති රැස්වීම්වල දී ද ඒ කතාව කියා ඇත. ඔහුට විරුද්ධව ඒ පිළිබඳ චෝදනා ඉදිරිපත් කෙරී ඇත්තේ සිවිල් අධිකරණයෙහි මිස හමුදා අධිකරණයෙහි නො වේ. එයට විශේෂිත හේතුවක් ඇත්දැයි අපි නො දනිමු. ඒ කෙසේ වෙතත් ඓතිහාසික ජයග්‍රහණයෙන් අවුරුද්දකට පසුවත් ඒ පිළිබඳ පැහැදිලි විග්‍රහයක් කර ජනතාව අතර ඇති දුර්මත නැති නොකිරීම ගැන අපට සතුටු විය නො හැකි ය.

ඒ හැරෙන්නට ජයග්‍රහණය ආපසු හරවන්නට සූදානම් වන්නෝ වෙති. සම්බන්ධන් ප්‍රමුඛ ඇතැම් දෙමළ ජාතිවාදී දේශපාලනඥයන් පමණක් නොව සිංහල පඬියෝ ද ඒ පිළිබඳ විකාර කතා කියති. නන්දිකඩාල් කලපුවේ ගිල්වාලනු ලැබුයේ දෙමළ ත්‍රස්තවාදය පමණක් නො වේ. පොන්නම්බලම් රාමනාදන්ගේ සිට ක්‍රියාත්මක වූ සිංහල විරෝධී දෙමළ දේශපාලනය ද එහි ගිල්වනු ලැබිණි. ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා යන කෘතියෙහි සඳහන්කෙරී ඇති පරිදි ප්‍රභාකරන් යනු පොන්නම්බලම් රාමනාදන්ගේ දේශපාලන මුණුබුරෙකි. චෙල්වනායගම් යනු අවිහිංසාවාදී දේශපාලනඥයෙක් නො වී ය. ඔහු ඊනියා අවිහිංසාවාදී සත්‍යග්‍රහ හා වෙනත් ව්‍යාපාර ඔස්සේ දෙමළ ජනයා සිංහල ජනයාට විරුද්ධ ව මෙහෙය වී ය. ප්‍රභාකරන් ඉදිරියට ගෙන ගියේ චෙල්වනායගම්ගේ දේශපාලනය ය.

සම්බන්ධන් අද කරන්නේ නැවතත් චෙල්වනායගම්ගේ දේශපාලනය ඇරඹීමට ය. ඒ කෙළවර වනුයේ තවත් ප්‍රභාකරන් කෙනකු බිහිකිරීමෙනි. අප මේ දේශපාලනය පරාජය කරන්නේ කෙසේ ද? පළමුවෙන් ම අප දෙමළ ජාතිවාදයේ පදනම තේරුම් ගත යුතු ය. එහි දී ලන්දේසීන්ගේ හා ඉංගිරිසින්ගේ කාර්යභාරය ගැන ජනයාට කරුණු පැහැදිලි කළ යුතු ය. දෙමළ ජාතිවාදය ඇරඹුණේ ද පවත්වාගෙන යන්නේ ද සිංහලයන්ට හා සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමිවිය යුතු තැන අහිමි කිරීමට මිස අනෙක් කරුණකට නො වේ. ඉංගිරිසින් යටතේ ඉංගිරිසි කතාකළ දෙමළ ජනයාට ලැබුණු විශේෂ වරප්‍රසාද එලෙසින් ම පවත්වාගෙන යෑමට කටයුතු නොකළ විට දෙමළ නායකයෝ ඒ සමස්ත දෙමළ ජනයාට වූ අසාධාරණයක් ලෙස අර්ථකථනය කළහ.

සිංහල ජාතිකත්වය මෙන් නොව දෙමළ ජාතිකත්වය ක්‍රියාකරන්නේ උඩ සිට පහතට ය. දෙමළ නායකයන් නොවන්නට දෙමළ ජාතිවාදයක් නැත. අද ආණ්ඩුව හා ශ්‍රී ල නි ප කළ යුත්තේ දෙමළ නායකයන් මගහරිමින් සෘජුව දෙමළ ජනතාව ඇමතීම ය. වෙනත් වචනවලින් කිවහොත් ශ්‍රී ල නි ප දෙමළ ජනයාට ද නායකත්වය දිය යුතු ය. පසුගිය මැතිවරණයේ දී දෙමළ ජනයාගේ ඡන්ද සැලකිය යුතු ප්‍රමාණයක් එක්සත් ජනතා නිදහස් සංධානයට ලැබී ඇත. ඒ වැදගත් කරුණකි. අද කිනම් ආකෘතියක වුව ද සංවර්ධන ව්‍යාපෘති රාශියක් මෙරට ක්‍රියාත්මක වෙයි. පසුගිය දා හම්බන්තොට වරාය තැනීමේ කටයුතු නැරඹීමේ අවස්ථාව අපට උදාවූයේ මිත්‍රයකුගේ මාර්ගයෙනි. රට ඇතුළේ එවැනි වරායක් ඉදිකිරීම වුව ද භාරදූර කාර්යයකි. ඒ සම්බන්ධ ගෞරවය ආණ්ඩුවට, වරාය අධිකාරියට හා අදාළ වෙනත් අයට හිමිවිය යුතු ය. උතුරේ හා නැගෙනහිර උතුරු වසන්තය හා නැගෙනහිර උදානය යම් ආකාරයකින් දෙමළ ජනතාවගේ හදවත්වලට කාන්දුවන බව පසුගිය මැතිවරණයෙන් පැහැදිලි වෙයි. ශ්‍රී ල නි ප කළ යුත්තේ දෙමළ ජනයා සෘජුව ආමන්ත්‍රණය කරමින් ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කරගනිමින් යම් ආකාරයක වුව ද සංවර්ධනයක් ඔවුන්ට ද අනෙක් පළාත්වලට ද ලබාදීම ය. එහෙත් ඒ අතර අප නොබියව කිවයුතු දෙයක් වෙයි. එනම් මේ රට ප්‍රධාන වශයෙන් ම සිංහල බෞද්ධ රට බව ය. සංස්කෘතික විවිධත්වය යනු සියලු සංස්කෘතීන් එකම මට්ටමේ ලා සැලකීම නො වේ. ලෝකයේ කිසිම රටක සියලු සංස්කෘතීන්ට එකම මට්ටමක් නැත. එංගලන්තයේ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතියට හිමි තැන එහි සිංහල බෞද්ධ සංස්කෘතියට හෝ දෙමළ හින්දු සංස්කෘතියට හෝ අයත් නො වේ. අප රටේ විශේෂිත සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය වෙයි. දෙමළ ජනයාට ඒ බව ඒත්තු ගැන්වීමට හැකි වෙයි. කළ යුත්තේ මෙහෙයුම්වල දී මෙන් එක් සිත්ව ඒ වෙනුවෙන් කටයුතු කිරීම ය. එහි දී දෙමළ ජාතිවාදී දේශපාලනඥයන් හා සිංහල පඬියන් තුට්ටුවකටවත් මායිම් නොකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva